# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

NAQDA

# පුරප්පාඩු

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) පහත පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අධ්‍යක්ෂ (ව්‍යාප්ති) තනතුර - HM - 1-1 - 2025**

**02. අධ්‍යක්ෂ (වෙරළබඩ) තනතුර - HM - 1-1 - 2025**

**03. අධ්‍යක්ෂ (මිරිදිය) තනතුර - HM - 1-1-2025**

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන්**

(a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ සත්ව විද්‍යාව හෝ ජලජීවී වගාව/ධීවර කටයුතු පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධිය හෝ ආහාර විද්‍යාව සහ පෝෂණය / කෘෂිකර්මය/පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ මූලික උපාධිය

**සහ**

(b) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජල ජීවී වගාව/ධීවර කටයුතු ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම (විද්‍යාපති/දර්ශනපති) සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලය/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**සුදුසුකම් හා පළපුරුද්ද : අභ්‍යන්තර අයදුම්කරුවන්**

(a) NAQDA හි ජලජීවී වගාව/මිරිදිය/වෙරළබඩ/ව්‍යාප්ති සේවා තුළ මධ්‍යම කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) කාලයක් සේවය කර තිබීම.

**04. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) - MM 1 - 3 - 2025 ii ශ්‍රේණිය**

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන්**

(a) කළමනාකරණය / මානව සම්පත් පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සහ රජයේ දෙපාර්තමේන්තුවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසර එකක (01) පරිපාලන අත්දැකීමක් ලබා තිබීම.

**සුදුසුකම් හා පළපුරුද්ද : අභ්‍යන්තර අයදුම්කරුවන්**

(a) අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා සිටීම.

**05. භාෂා පරිවර්තක තනතුර - MA - 4 - 2025 iii ශ්‍රේණිය**

**සුදුසුකම් සහ පළපුරුද්ද**

(a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට විශිෂ්ට සාමාර්ථ ලබා තිබීම

**සහ**

(b) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

**සහ**

(c) ඉංග්‍රීසි - දෙමළ භාෂා පරිවර්තනය පිළිබඳව වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**පොදු කොන්දේසි : 2027 වසරට අදාළ වැටුප් පරිමාණය**

| අනු අංකය | තනතුරු නාමය | වැටුප් කේතය | වැටුප් පරිමාණය | වයස් සීමාව |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ (ව්‍යාප්ති) | HM 1 - 1 2025 | 140,640 - 15 x 4100 – 202,140 | අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය |
| 02 | අධ්‍යක්ෂ (වෙරළබඩ) | HM 1 - 1 2025 | 140,640 - 15 x 4100 – 202,140 | |
| 03 | අධ්‍යක්ෂ (මිරිදිය) | HM 1 - 1 2025 | 140,640 - 15 x 4100 – 202,140 | |
| 04 | සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) | MM -1-3 2025 | 96,650 -10 x 2480 –15 x 3450 – 173,200 | අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය |
| 05 | භාෂා පරිවර්තක | MA 4 - 2025 | 64,320- 10x 1360 - 15 x 1670 - 5 x 2,040 – 113,170 | |

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති 1/2025 චක්‍රලේඛයට අනුව 2026 වර්ෂයේ වැටුපට ගලපා ගෙවනු ලැබේ.

**සටහන** : අභ්‍යන්තර අපේක්ෂකයන් සහ රජයේ/පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

: සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) තනතුර සඳහා තෝරා ගැනීමේ දී රාජ්‍ය ආයතන වල ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සුදුසුකමක්/පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

: භාෂා පරිවර්තක තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන් වාචික හා ලිඛිත කුසලතා ඉහළ මට්ටමක පැවතිය යුතුය.

- රජයේ/පළාත් පාලන දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
  - අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
  - තනතුරේ රාජකාරි ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
  - අයදුම්කරුවන් උසස් චරිතයකින් හෙබි විය යුතුය.
- ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන අනෙක් ප්‍රතිලාභ
  - වෛද්‍ය ප්‍රතිලාභ
  - රජය විසින් ව්‍යවස්ථාපිත ආයතන සඳහා අනුමත දීමනා.
- **www.naqda.gov.lk** වෙබ් පිටුවෙහි පළ කර ඇති උක්ත තනතුරු සඳහා අදාළ වන අයදුම්පත් ආකෘතියට අනුව ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් (ජීව දත්ත) පත්‍රය සහ ඊට අදාළ සියලුම සහතිකවල ඡායාපිටපත් සමග අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑල හරහා **"සභාපති, ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල"** යන ලිපිනයට **2026.08.10** දිනට පෙර එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**